# 2026 මාර්තු මස 12 දින වත්තේගම නගර සභා රැස්වීම් ශාලාවේ දී පැවති මහා සභා වාර්තාව

➢ **සහභාගී වීම**

| | | |
|---|---|---|
| 1. | ඩී.එස්. උයන්ගොඩ මහතා | - ගරු සභාපති |
| 2. | ජේ.ඒ.යූ. ගමගේ මහතා, | - ගරු උප සභාපති |
| 3. | එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 4. | ඒ.එම්. මොනිකා අබේකෝන් මහත්මිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 5. | ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 6. | බී.ඒ.දුමින්ද පෙරේරා මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 7. | ර්.ජී.ජේ. ආරියවංශ මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 8. | ඒ.ජී.ආර්. ගුණවර්ධන මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 9. | ආර්.ජී.යූ.සෙතානි රාජමන්ත්‍රී මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 10. | ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 11. | ඩී.ජී.එස්. විජේසූරිය මහත්මිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 12. | අයි.එම්.එස්.ආර්. රණසිංහ මහත්මිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 13. | ඩබ්.ටී. රාජමන්ත්‍රී මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 14. | ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 15. | වී.බී.වස්ගේවත්ත මහතා | - ලේකම් |

➢ සහභාගී නොවීම -

| | | |
|---|---|---|
| 01. | සී.ඩී. ගුරුගල්ගේ මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 02. | ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |

ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු පෙ.ව 10. 00 ට ආරම්භ විය.

(අ)

**1. 2026.02.12 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ස්ථිර කර ගැනීම**

1.1 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

ඒ අනුව න්‍යාය පත්‍රානුකූලව මුලින්ම ඇත්තේ 2026.02.12 දින පැවති මහා සභා වාර්තාව ස්ථිර කර ගැනීමයි. මේ පිළිබඳව සංශෝධන ඇත්නම් ඒ සඳහා අවස්ථාවයි.

<u>1.2 ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, 2025.12.11මහා සභා වාර්තාවේ පිටු අංක 14 හි සඳහන් නැවත සංශෝධනය කිරීම් වල සඳහන් වෙලා තියෙනවා ඔබතුමා සඳහා සම්බන්ධීකරන නිළධාරිනියක් ගැනීම සඳහා ඒකමතිකව සභා සම්මත විය කියලා. නමුත් මම කියන්න කැමති මෙලෙස බඳවා ගැනීම ගැන මගේ කිසිම ගැටළුවක් නැ. නමුත් සභා අරමුදලින් වැටුප් ගෙවීම සඳහා මගේ විරෝදය දක්වනවා කියලා.

1.3 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

නැ මම එලෙස යෝජනා කරාට කවුරුත් බඳවා ගැනීමක් සිදු කලේ නැ. මේ තියෙන්නේ සම්මත කර ගැනීමේ පිළිවෙලේ පැවති දෝශයක් නිසා නැවත සභාවට යොමු කිරීමක් පමණයි.

1.4 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් 2026.02.12 දිනැති මහා සභා වාර්ථාව ස්ථිර කරන ලදි.

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2026.02.12 දින පැවති මහා සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

.පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම ,පෙත්සම් ,නගර සභාව අමතා එවන ලද ලිපි (ඉ)

- ශ්නවිධිවූ පරිදි කලින් ලියා එවා තිබෙන ප්‍ර (උ) **නැත**

විධිවූ පරිදි කලින් ලියා එවා තිබෙන යෝජනා (එ)

01. <u>ගරු සභාපති ඩී.එස් .උයන්ගොඩ මහතාගේ යෝජනා</u>

1. සෞඛ්‍ය කම්කරු තනතුරෙහි දෛනික පදනම මත සේවයේ යොදවාගෙන ඇති සේවක මහතාගේ අනුමත සේවා කාලය 2026.04.2026 දිනෙන් අවසන් වන බැවින් 30.05.2026 දින සිට 01.05. 09 2026 ඉන් ඔබ්බට ,දින දක්වා සේවා කණ්ඩනය සිදුකර.05.ක 06 දින සිට තවදුරයත් මාස 10 කාලයකින් ඔහුගේ සේවා කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහා සභාව වෙත යෝජනා කරන ලදි.

1.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

1.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

1.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

1.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් සෞඛ්‍ය කම්කරු තනතුරෙහි සේවයේ යොදවා ගන්නා සේවක මහතාගේ සේවා කාලය 2026.05.10 සිට තවත් මාස 06කින් දීර්ග කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

2 සභාව සතු **CPZA**2025 යේබැකෝ යන්ත්‍ර 5245 – -වර්ෂයට අදාලව රක්ෂණය සඳහා ගාස්තු 2026 ය සඳහා ය ධාවනයට අදාලව පමණක් ගාස්තු ගෙවා ඇති අතර යන්ත්‍රගෙවීමේදී එම බැකෝ යන්ත්‍ර .යේ රක්ෂණය අදාලව රුඑම යන්ත්‍ර .ගාස්තු ගෙවා නැත45,346.41 ක මුදල වර්ෂයට අදාල 2025 ගෙවීමක් බැවින් එය සමුච්චිත අරමුදලින් අරමුදලින් ගෙවීමට (භාර රක්ෂණ සමාගම වෙතඅග්‍ර) අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහා සභාව වෙත ඉදිරිපත්කරන ලදි.

2.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

2.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

2.1.3 <u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා</u>
ගරු සභාපතිතුමනි, රාජ්‍ය ආයතනයක් විදියට මෙම වාහාන රක්ෂණය කිරීමේදී විර්ෂණයක් සිදු වන්නේ නැද්ද?

2.1.4 මන්ත්‍රීතුමා අපි මේ පිළිබඳව පසුව විමර්ෂණයක් සිදු කරමු. දැනට ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන්න විතරයි අවශ්‍ය.

2.1.5 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

2.1.6 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් CPZA – 5245 බැකෝ යන්ත්‍රයේ 2025-2026 වර්ෂයට අදාලව රක්ෂණය සඳහා ගාස්තු ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**3** 2025.12.කාශයේ නිවැරදි කරන ලද පහත කරුණු දිනට සකස් කරන ලද අවසන් ගිණුම් ප්‍ර 31 .සම්බන්ධයෙන් ගරු මහා සභාවේ දැනුවත් වීම සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි

I. අවසන් ගිණුම් වල පැරණි ණයහිමි ශේෂයන් ආදායමට ගැනීම.
II. පැරණි තැන්පත් උපලේඛනවල තිබූ ශේෂයන් ආදායමට ගැනීම.
III. ලී බඩු හා සවිකිරීමේ උප ලේඛණය හා යන්ත්‍ර ,කාර්යාල උපකරණ උපලේඛණය , ලේඛණගත අංක සමඟ නිවැරදි කර ඉදිරිපත් ඉන්වෙන්ට්‍රි ,පකරණ උප ලේඛණයයන්ත්‍රෝ .කිරීම
IV. මේ වන තෙක් ඉඩම් හා ගොඩනැගිලි උපලේඛණයක් ගිණුම්ගත වී නොතිබූ බැවින් පෙර තක්සේරු මුදල මත 2025.12.දි 31නට ගිණුම ගත කිරීම.

මේ අනුව නිවැරදි කරන ලද 2025.12.2026කාශනයදිනට අදාල වාර්ෂික ගිණුම් ප්‍ර 31.02. 27 .වන දින විගණනයට භාර දෙන ලදි

3.1.1 ඒ අනුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

3.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

**ගරු මහා සභාවේ දැනගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලදි.**

**4** අවසන් ගිණුම් ප්‍රකාශ වල සඳහන්ව ඇති පැරණි ණයගැති ශේෂ පිළිබඳව කමිටුවක් විසින් පරීක්ෂාකර බලා වර්ෂයේ පටන් උපලේඛණගතව ඉදිරිපත් කර ඇති 1990 වර්ෂයට පෙර සිට 2020 .රු1,751,723.80 ක මුදලින් මෙම වර්ෂයේ ගිණුමෙන් කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගත යුතු මුදල පිළිබඳව ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

4.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

4.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

4.1.3 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා ගරු සභාපතිතුමනි, මේ තියෙන තොරතුරු ප්‍රමාණවත් මදි ආණ්ඩුකාර අනුමැතියට යැවීමට. ඒ නිසා අපි තවදුරටත් විමසීම් කරලා එකවර පොත් වලින් කපාහැරිය යුතු මුදල ගණනය කර ගරු ආණ්ඩුකාර අනුමැතියට යවමු.

4.1.4 ඒ අනුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

4.1.5 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් තවදුරටත් සොයා බලා පොත් වලින් කපා හැරිය හැකි සම්පූර්ණ මුදල සඳහාම ගරු ආණුඩුකාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.**

5 ඉරිදා පොළ භූමිය පිළිබඳව කර්මාන්ත ජල හා විදුලි කාරක සභාව විසින් 2026.02.දින සිදු කරන 18 පරීක්ෂලද ක්ෂේත්‍රාව අනුව සකස් කරන ලද නිරීක්ෂණ වාර්තාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

5.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

5.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

**ගරු මහා සභාවේ දැනගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලදි.**

6 වත්තේගම නගර සභාවට අයත් දෙල්ගහලන්ද ඉඩමෙන් අක්කර 02,රූඩ 03, පර්චස් 14.ක ඉඩම 92 කොටස සඳහාබලය ලත් මිනින්දොරු ටීඩී හේවගේ මහතා විසින් සකස් කරන ලද සංශෝධිත .සී. ක් සකස් කර භාරදීම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති 47 ට අයත් ඉඩම් කැබලි429 පිඹුරුපත් අංක .බිල්පතට අනුව රු235,000.00 .රු)5,000.00× 47=235 ,000.00) ක මුදලක් ඔහු වෙත ගෙවීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට යෝජනා කරමි.

6.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

6.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

6.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

6.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් මිනින්දෝරු ටී.සී.ඩී හේවගේ මහතා විසින් දෙල්ගහලන්ද ඉඩම සඳහා සකස් කරන ලද බිල්පතට රු.235,000.00 ක මුදල ගෙවීමට ගරු මහා සභාව ඒකමතිකව සම්මත විය.**

7 වත්තේගම නගර සභාවේ පස්වරු පොළේ ආදායම එක්රැස් කිරීම මත 2025.06. දින සිට 30 2025.12. දක්වා කාලසීමාව 30සඳහා හිමිවිය යුතු ක්ෂේත්‍ර දීමනා මුදල ලබා ගැනීම සඳහාත්2026.02. 22 10 දින සිට ආරම්භ කරන ලද සති පොළේ ආදායම එක්රැස් කිරීම මත ආදායමෙන්%ක මුදලක් ගෙවීම සඳහා නගර සභාවේ සේවයේ නියුතු ඒමුදල් හා ,පී කරුණාරත්න මහතා විසින් කර ඇති ඉල්ලීම. තිපත්ති කාරක සභා නිර්දේශය මප්‍රත ගරු මහා සභාවට යෝජනා කරමි.

7.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී. රාජමන්ත්‍රී මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

7.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

7.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

7.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නගර සභාවේ පස්වරු පොළේ ආදායම එක්රැස් කිරීම මත ආදායමෙන් 10%ක මුදලක් නගර සභාවේ සේවයේ නියුතු ඒ.පී කරුණාරත්න මහතාට ගෙවීමේ යෝජනාව ගරු මහා සභාව ඒකමතිකව සම්මත විය.**

8 දිට්වා සුලි කුණාටුව හා ගංවතුර ආපදා තත්වය හේතුවෙන් අවතැන් වූ ජනතාව වෙනුවෙන් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් ලබා දීම යන මැයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවන ලද ලිපියට අදාලව 595-වත්තේගම උතුර ග්‍රාම නිලධාරී වසමේ වත්තේගම නගර සභාවට අයත් නුවරතැන්න ඉඩම යනුවෙන් හදුන්වන පර්චස් ක් පමණ වන ඉදිකිරීම් රහිත ඉඩම් කොටස නැවත පදිංචි කිරීම සඳහා 40 යොදා ගැනීමේ හැකියාව විමසා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එවන ලද ලිපිය ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි) .2026.02.18 කර්මාන්ත 16 ජල හා විදුලි කාරක සභා වාර්තාවේ, (පිටුවේ ඇත

8.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

8.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

8.1.3 ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මැතිතුමා

ගරු සභාපතිතුමනි මම දන්න විදියට මෙම කියන කොටස තියෙන්නේ අපේ උඩුරාවණ ක්‍රීඩාංගනයට පිටුපසින් නමුත් යම් කාලයක අපි ක්‍රීඩාංගනය විශාල කිරීමකදී මෙම කොටස ප්‍රයෝජනවත් වෙනවා.ඒ අනුව තවදුරටත් සාකඡ්වා කරලා මේ පිළිබඳව තීරණයක් ගමු.

8.1.4 ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය
සභාපතිතුමනි, ඇයි මෙම කොටසම ප්‍රාදේශීය ලේකම්තුමිය ඉල්ලලා තියෙන්නේ?

8.1.5 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා
ප්‍රාදේශීය ලේකම්තුමිය ග්‍රාමසේවකවරුන්ගෙන් විමසා ඇති අතර වුන් විසින් මෙම භූමිය පිළිබඳව ග්‍රාමසේවක මහතාගේ ඉදිරිපත් කිරීම මත මෙම ඉඩම යෝජනා වෙලා තියෙන්නේ.

8.1.6 මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ගරු මහා සභ සභාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර් ගුණවර්ධණ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

8.1.7 කාරක සභා අවස්ථාවේදී ලේකම් වී.බී වස්ගේවත්ත මහතා විසින් කරුණු පැහැදිලි කිරීමක් සිදුකරන ලදි.

8.1.8 පසුව කාරක සභාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් නැවත මහා සභාවක් කල අතර ගරු නගර සබා මන්ත්‍රී ඊ.ජී.ජේ ආරියවංශ මැතිතුමා විසින් එම යෝජනාව ස්තිර කරන ලදි.

8.1.9 පසුව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව තීරබයක් ගැනීම සුදුස බවට වූ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් දිට්වා සුලි කුණාටුවෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් කරන ලද ඉල්ලීමට අනුව 595 වත්තේගම උතුර ග්‍රාම නිළධාරී වසමේ නුවරතැන්න කොට්ඨාශයේ ඉඩම ලබා දීම සඳහා වැඩි දුරටත් සාකච්ඡා කළ යුතු බවට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.**

9 නගර සභාව සතු CANON IR 2006 මුද්‍රණ යන්ත්‍රය සඳහා මෙට්‍රෝපොලිටන් සමාගම සමඟ 2026 .වර්ෂය සඳහා ගිවිසුම්ගත වීම වෙනුවෙන් ගෙවිය යුතු වන රු23,718.00 ක මුදල ගෙවීම සඳහා වන ඉල්ලීම සහ මුද්‍රණ යන්ත්‍රයේ ඩ්‍රම් යුනිට් එක ප්‍රස්ථාපනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු වන රු.83,267.17ක මුදල ගෙවීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට යෝජනා කරමි.

9.1.1 ඒ අනුව ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනව ස්ථ්ර කරන ලදි.

9.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

9.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

9.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නගර සභාවේ CANON IR 2006 මුද්‍රණ යන්ත්‍රය සඳහා මෙට්‍රෝපොලිටන් සමාගම සමඟ 2026 වර්ෂයට ගිවිසුම්ගත වීමට අදාල රු.23,718.00 ක මුදල ගෙවීමේ යෝජනාව ගරු මහා සභාවේදී ඒකමතිකව සම්මත විය.**

10 ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය 2025/සඳහා ඉදිරිපත් වීමට අදාල අප ආයතනයේ 26 .ගරු මහා සභාව් දැන ගැනීම සඳහා ඉදිරිපත් කරමි (ඇමුණුම් සමඟ)ය සහිත පොතඅයදුම්පත්‍ර

10.1.1 මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ගරු මහා සභ සභාව ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ගරු මහා සභාව කාරක සභාවක් කිරීමට යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර් ගුණවර්ධණ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

10.1.2 කාරක සභා අවස්ථාවේදී ලේකම් වී.බී වස්ගේවත්ත මහතා විසින් කරුණු පැහැදිලි කිරීමක් සිදුකරන ලදි.

10.1.3 පසුව කාරක සභාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස් විජේසූරිය මැතිනිය විසින් නැවත මහා සභාවක් කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

10.1.4 පසුව ගරු නගර සභා මන්ත්‍රී එච් . ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු මහා සභාවේ දැනගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලදි.**

11 2026.01.කර්මාන්ත කමිටුව සඳහා යොමුකළ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ 21 වර්ෂය සඳහා ටෙන්ඩර් කැඳවා 2026 පැරණි නගර සභා ගොඩනැගිල්ලේ වහලය අබලන්ව ඇති බැවින් බදු ලබා ,බදු ලබා දීමට කටයුතු කල නමුත්දීමට නොහැකි වියඒ සඳහා බදු ගැනුම්කාර පාර්ශවය . .විසින් රු736,500.00 මුදලක් මේ වන විට ගෙවා ඇති බැවින් මෙම අලුත්වැඩියාව කඩිනමින් සිදු කිරීම සඳහා කටයුතු කරන ලදිඑබැවින් එම වහලය ඉදි කිරීම සම්බන්ධව වැඩ අධිකාරීතුමා විසින් ඉදිරිපත් . 2026 කර ඇති ඇස්තමේන්තුව හා වාර්තාව.01.තිපත්ති කාරක සභා නිර්දේශය පැවති මුදල් හා ප්‍ර 28 .මත ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි

11.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා විසින් යෝජනව ස්ථ්ර කරන ලදි.

11.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

11.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

11.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් දිට්වා කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ වත්තේගම පැරණි නගර සභා ගොඩනැගිල්ලේ වහලය අළුත්වැඩියා කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**12** පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/4/ සංවර්ධන ව්‍යාපෘති 2026 හා 2025.01.දිනැති ලිපිය අනුව 26 - පෘති අනුමත කිරීමපළාත් නිශ්චිත ව්‍යා2026

ඒ අනුව ඝණ අපද්‍රව්‍ය යටතේ අනුමත වී ඇති වත්තේගම නගර සභාවේ කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වාර්තාව පිළිබඳ සාකච්ඡාව.

12.1.1 මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ගරු මහා සභ සභාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ගරු මහා සභාව කාරක සභාවක් කිරීමට යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ ආරියවංශ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

12.1.2 කාරක සභා අවස්ථාවේදී පරිසර විෂය භාර නිළධාරී අනුෂා නානායක්කාර මහත්මිය විසින් කරුණු පැහැදිලි කිරීමක් සිදුකරන ලදි.

12.1.3 පසුව කාරක සභාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් නැවත මහා සභාවක් කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර් ගුණවර්ධන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඇමුණුම 12

වත්තේගම නගර සභාවට අයත් මියන්පාහේවත්ත පිහිටි නාගරික කසල අංගනය තුළ කොම්පෝස්ට අංගනයක් ඉදිකිරීමට අදාළව 2026 වසරේදී පළාත් සභා අරමුදල් යටතේ රුපියල් මිලියන 25.66 ක මුදලක් වෙන් කර ඇති අතර ඒ සදහා වූ සාධාරණීකරණ වාර්තාව

- ❖ වත්තේගම මාතලේ මාර්ගයේ කි.මී.01 කණුව අසළ නාගරික කසළ අංගනය පිහිටා තිබේ.නගර සීමාව තුළ දෛනිකව එකතු කරනු ලබන දිරන /නොදිරන කසළ ගොඩගැසීම සදහා මෙම ස්ථානය භාවිතා කරනු ලැබේ.
- ❖ අක්කර 01ක පමණ භූමි ප්‍රමාණයකින් යුත් මෙම ඉඩමේ ඉදිරිපස වත්තේගම මාතලේ මහා මාර්ගයටද අනෙක් පැති පෞද්ගලික ඉඩමකට සහ කුඹුරු යායකට මායිම්ව පවතී. දිනකට ටොන් 01 පමණ කසළ ප්‍රමාණයක් වසර 50 කට වැඩි කාලයක් තිස්සේ මෙම ස්ථානයට බැහැර කරනු ලබන අතර දැන් එම භූමියට දරා ගැනීමට නොහැකි තරමට කසළ එකතු වී ඇත.
- ❖ කසළ එකතු කිරීම තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි තරමට මෙම බිම් කොටස සංතෘප්ත වී ඇත.
- ❖ දිරණ සහ නොදිරණ කසළ මෙහි ගොඩගසා ඇති අකර ප්ලාස්ටික් බෝතල් සහ කාඩ්බෝඩ් වැනි දෑ ඉවත් කර ප්‍රතිචක්‍රීකරණයට යොමු කරනු ලැබේ.
- ❖ ප්ලාස්ටික් සහ පෙට් (PET) බෝතල් ප්‍රතිචක්‍රීකරණය සදහා කුණ්ඩසාලේ ප්‍රාදේශිය සභාවට යවනු ලබන අතර පසුගිය වසර කිපයක ලද ආදායම පහත දක්වා ඇත .

| වර්ෂය | යවනු ලැබූ ප්‍රමාණය (කි්‍ර.ගෑම්) | ලද මුදල |
|---|---|---|
| 2023 | 940 | 25750.00 |
| 2024 | 986 | 24650.00 |
| 2025 ජූනි දක්වා | 200 | 5000.00 |

දිරන කසළ කුණ්ඩසාලේ ප්‍රාදේශිය සභාවට යොමු කරන අතර පසුගිය වසර කිපයක ඒ සදහා වූ වියදම පහත දක්වා ඇත.

| වර්ෂය | යවනු ලැබූ ප්‍රමාණය ටොන් | දරණ ලද වියදම රුපියල් |
|---|---|---|
| 2023 | 69.19 | 102263.00 |
| 2024 | 30.48 | 48768.00 |
| 2025 ජූනි දක්වා | 41.80 | 66880.00 |

දහනය කිරීම සඳහා ලිහිල් පොලිතින් අකුරණ ප්‍රාදේශිය සභාවට යවනු ලබන අතර පසුගිය වසර කිහිපයක ඒ සඳහා දරණ ලද වියදම පහත දක්වා ඇත.

| වර්ෂය | යවන ලද ප්‍රමාණය (ටොන්) | දරණ ලද වියදම (රුපියල්) |
|---|---|---|
| 2023 | 31.786 | 1271440.00 |
| 2024 | 8.524 | 340960.00 |
| 2025 ජුනි දක්වා | 8.189 | 614175.00 |

පොලිතින් දහනය කිරීම සඳහා කලින් ක්‍රි.ගෑම් එකකට රුපියල් 40.00 අයකර ඇති අතර එය මේ වන විට රු 75.00 දක්වා වැඩිකර ඇත.

මෙසේ අපද්‍රව්‍ය කුණ්ඩසාල හා අකුරණ ප්‍රාදේශිය සභාවලට යැවීමේදී ඒ සඳහා වන ප්‍රවාහන වියදම් සහ සේවක වියදම් නොසලකා හැර ඇත. ඒ මුදලද එකතු කළහොත් වියදම තවත් ඉහළ යනු ඇත.

- ❖ වත්තේගම නගරය තුළ දිනපතා දිනකට එකතු කරනු ලබන දිරන කසළ ප්‍රමාණය ටොන් 01 ක් පමණ වනු ඇත. දැනට මෙම කසල කොම්පෝස්ට් පොහොර සැකසීම සඳහා කුණ්ඩසාල ප්‍රාදේශිය සභාවට යොමු කරන අතර සේවක වියදම් හා ප්‍රවාහන වියදම්ද නොසලකා හැරිය විටදීද වසරකට රුපියල් ලක්ෂයකට වඩා වියදමක් දරණු ලැබේ.

- ❖ මෙම කසල භාවිතා කරමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමට යෝජනා කරමි. ඒ අනුව මෙම කසළ අංගනය තුළ තව දුරටත් කසළ ඒකරාශි වීම නතරවන අතර නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීමෙන් ආදායමක්ද ලබා ගත හැකි වනු ඇත .

- ❖ ඉවතලන ප්ලාස්ටික් පෙට් බෝතල් ආදිය ප්‍රතිචක්‍රීකරණය සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේනම් එය ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස යොදා ගැනීමට හැකිවනු ඇත

- ❖ කසළ එකතු කිරීමේ යෙදී සිටි සහ දැනටමත් එම සේවයේ යෙදි සිටින අයගේ පවුල් 10ක් පමණ කිසිදු සෞඛ්‍ය පහසුකමක් නොමැති ඉතා අපිරිසිදු පැල්පත් අටවාගෙන මෙම අංගනයේ එක් කොටසක ජීවත් වෙමින් සිටිති.
මෙම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ක්‍රියාවලියට මෙම නිවාස වල වාසය කරන රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සහ ගෘහණියන්ගේ සේවය ලබා ගැනීමට හැකිවන බැවින් ඔවුන්ගේ ජීවන තත්වය උසස් වීමටද එය හේතුවක් වනු ඇත.

- ❖ දැනට වරින්වර කසළ ගිනි තැබීම සහ ඉබේ ගිණි ගැනීම නිසා අධික දුර්ගන්ධයක් සහ දුමක් ජනනය වන අතර එය මේ කසළ අංගනය අවට ජීවත්වන නාගරික වැසියන්ගේ සෞඛ්‍ය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි.මේ සම්බන්ධයෙන් දැනටමත් නගර සභාව වෙත පැමිණිලි ලැබෙමින් පවති.

- දිරණ කසල වර්ගීකරණය කර ඒවා යන්ත්‍රානුසාරයෙන් කුඩා කැබලිවලට කඩා නියමිත ක්‍රමවේද අනුගමනය කරමින් නියමිත කාලයක් තුළ දිරායාමට සලස්වා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා වහල ආවරණයක් සහිත සිමෙන්ති බිමක් සකස් කිරීම
- තෝරණ ලද දිරණ කසල කුඩා කැබලිවලට කැඩීම සඳහා යන්ත්‍රයක් සවි කිරීම
- දැනට දහනය කිරීම සඳහා අකුරණ ප්‍රාදේශිය සභාවට යවනු ලබන ලිහිල් පොලිතින් දහනය කිරීම සඳහා දහනාගාරයක් සකස් කිරීම.
- පෙට් බෝතල් සහ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සවිකිරීම
- මේ මගින් නගරය තුළ නිතිපතා එකතුවන කසල කළමණාකරණය කර ගැනීමට මනා පිටිවහලක් ලැබෙනු ඇත.
- එමෙන්ම පිවිතුරු පුරවරයක්, කසළ වලින් තොර නගරයක් බිහි කර ගැනීමටද හැකිවනු ඇත.
- එමනිසා කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

13 <u>පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් CPC/ACLG/K/AM/10/01/2026 අංක දරන 5.02.20 දිනැති මහා සභා වාර්තා සඳහා නිරීක්ෂණ ලබා දීම -2025.11.14 මහා සභාව යන මැයෙන් එවන ලද ලිපියෙහි සඳහන් නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ලෙස ඉදිරිපත් කළ යුතු යෝජනා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා යෝජන කරමි.</u>

1. .ඉ)012026 යවත්තේගම නගර සභාව සතු ඇඟිලි සලකුණු යන්ත්‍ර (.01.2026 සිට 01.12. 31 ක කාලය සඳහා වාර්ෂික ගිවිසුම අලුත් කිරීමට අදාළ යෝජනාව ඉදිරිපත් කරමි.

02. .ඉ)04වත්තේගම ( නගර සභාවේ 2025 සභා පොදු අරමුදල් යටතේ සිදුකරන ලද ව්‍යාපෘති හා ඒවා පිරිනමන සමිති සම්බන්ධව මහා සභාව දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කරමි.

| | කර්මාන්තය | මුදල | සමිතිය |
|---|---|---|---|
| 1 | කුඩුගල පාර ග්‍රාමයේ නිවෙස් සඳහා දිවෙන පාර අළුත්වැඩියා කිරීම | 450,000.00 | වත්තේගම සමෘද්ධි ප්‍රජා මූල සමිතිය |
| 2 | නාරංදණ්ඩ ඇලවෙල්ල පාර අංක 55බී නිවසට පිටුපස පාර සඳහා බැම්මක් ඉදි කිරීම | 500,000.00 | වත්තේගම උතුර එකමුතු ජ්යෙෂ්ඨ පුරවැසි සංසදය |
| 3 | ළමා පුස්තකාලය අභ්‍යන්තරයට ජලය ගලායාම වැළැක්වීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම | 300,000.00 | යහලතැන්න විහාරස්ථ දායක සභාව |
| 4 | මාතලේ පාර නිහාල් ගුණවර්ධන මහතාගේ ඉඩම අසළින් ආරම්භ වන කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම | 500,000.00 | සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය |

| | | | |
|---|---|---|---|
| 5 | 609 උඩුරාවන මාර්ගයේ දිවෙන මළ ඇළ පල්ලෙපහුර මාර්ගය කොටසෙහි පිටාර ගැලීම අළුත්වැඩියා කිරීම | 500,000.00 | දුම්බර ගොවි සංවිධානය |
| 6 | පල්ලෙපහුර අරලියලන්ද අතුරු මාර්ගයේ දුම්රිය මාර්ගය කරා දිවෙන ඉතිරි කොටසේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම | 500,000.00 | පුබුදු ග්‍රාම සංවර්ධන සමිතිය |
| 7 | පිටියෙගෙදර හරහා වත්තේගමට පිවිසෙන ප්‍රධාන මාර්ගයේ ඇල්ල සේදීයන ස්ථානය සඳහා බැම්මක් ඉදි කිරීම අදියර 1 | 1,000,000.00 | එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය |
| 8 | අංක160,නුවර පාර,වත්තේගම ලිපිනය සහිත නිවස අසළින් ගලා බසිනා ඇළ සඳහා ඉදිකර ඇති ඇළ බැම්ම උස්කොට බැඳීම | 100,000.00 | වත්තේගම සමෘද්ධි ප්‍රජා මුල සමිතිය |
| 9 | ගලදෙණිය පාර ලංකා මියගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම | 450,000.00 | වත්තේගම සමෘද්ධි ප්‍රජා මුල සමිතිය |
| 10 | නාරංදෙණ්ඩ මාර්ගය සංවර්ධනය කිරීම | 500,000.00 | වත්තේගම උතුර එකමුතු පුරවැසි සංසදය |
| 11 | බලහෙල පිටියෙගෙදර මාර්ගයේ කාණු පද්ධතියක් නොමැතිකම නිසා වර්ෂාවට සේදී යන වේල්ල සකස් කිරීම | 300,000.00 | යහලතැන්න විහාරස්ථ දායක සභාව |
| 12 | අරලියලන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 300,000.00 | දුම්බර ගොවි සංවිධානය |
| 13 | යටිරාවන ඇළඋඩවත්ත ගම්මානයට පිටිසෙන මාර්ගය හා සේවා පියසට පිවිසෙන මාර්ගය අළුත්වැඩියා කිරීම | 500,000.00 | ජ්යෙෂ්ඨ පුරවැසි සරණ සමිතිය |
| 14 | වත්තේගම නගර සභා කාර්යාලය ඇතුළත බිත්ත ආලේප කිරීම හා සිවිලිම අළුත්වැඩියා කිරීම | 563,450.00 | පුබුදු ග්‍රාම සංවර්ධන සමිතිය |
| 15 | බලහෙල මාර්ගයේ ටී.එම්බණ්ඩාර මහතාගේ නිවස අසල හානි වී ඇති කාපට් මාර්ගයට පැති බැම්ම සකස් කිරීම | 500,000.00 | යහලතැන්න විහාරස්ථ දායක සභාව |
| 16 | නුවරතැන්න මාර්ගයේ කැඩී ඇති ස්ථාන හා ඉහළ කොටස සංවර්ධනය කිරීම | 600,000.00 | ගුනැම්බිල්ල ගොවි සංවිධානය |

03. .ඉ)11 මැතිතුමා විසින් ඉදිරිපත් කළ එස් රාජමන්ත්‍රි.ආර්.යූ.ජී. ආර්ගරු නගර සභා මන්ත්‍රි ( වත්තේගම මාර්ගයේ ඇල්ල නායයෑම නිසා බැම්මක් බැදීමට වෙන් කරන -පිටියේගෙදර රාමචන්ද්‍ර නමුත් එම බැම්ම ඉදිකිරීම සඳහා එම මුදල් .ක මුදලක් වෙන් කරන ලදි 10 ලද රුපියල් ලක්ෂ මාණවප්‍රත් නොවන බැවින්වත්තේගම මාර්ගයේ කාණු - රාමචන්ද්‍ර ,එම මුදල් පිටියේගෙදර , තිස්ථාපණයපද්ධතිය හා මාර්ගයේ අබලන් වී ඇති කොටස් ප්‍රකිරීමට යොදා ගන්නා ලෙස යෝජනා කරමි.

04. (එ.01.2) 2025.07.08 දින පැවති මහා සභාවේදී ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන යටතේ ඉදිරිපත් කරන ලද "ඩෙංගු මර්ධන කටයුතු සඳහා යොදවාගෙන ඇති යූ ඒ දිසානායක මහතාගේ. 2025.06.2025 සිට 01.07.පිළිබඳ යෝජනාව නැවත "දක්වා ජූනි මස දෛනික වැටුප් ගෙවීම 03 .ඉදිරිපත් කිරීම

05. (එ.01.3) ජල අංශයේ භාවිතා කෙරෙන CAT2020 Automation පරිගණක මෘදුකාංගය විසින් ක්ෂේත්‍රයේදී ජංගම දුරකතනය භාවිතයෙන් මාර්ග ගත ක්‍රමය ඔස්සේ ජල බිල්පත් නිකුත් කිරීම සඳහා නව ක්‍රමවේදයක් )App එකක්යාත්මක කිරීම සඳහාහඳුන්වා දෙන ලද අතර එය ක්‍රි (, ජල මනු කියවන්නන් වෙත ස්මාර්ට් වර්ගයේ දුරකතන හා අන්තර්ජාල පහසුකම අවශ්‍ය වී ඇතඒ අනුව . ජල මනු කියවන්නකු වශයෙන් රාජකාරී කටයුතු කරන ඊදසනායක මහතාගේ .බී.ටී.ඩබ්.ඩී.එම්. ) ඩේටා වන ජංගම දුරකතනයට අවශ්‍ය10GB ප්‍රමාණයක්මාසිකව සුළු මුදල් වලින් ලබා දෙන ( ලෙස වන ඉල්ලීම අනුව නවApp එක ක්‍රියාත්මක කිරීම සඳහා ජල මනු කියවන්නෙකුට මසකට අවශ්‍ය වන ඩේටා ප්‍රමාණයෙන් අඩක් )05 GB ප්‍රමාණයක්සුළු මුදල (් වලින් ලබා දීම හා ඉතිරි ප්‍රමාණය තම වෘත්තිය සඳහා සපයා ගත යුතු බවත් කර්මාන්ත, ජල හා විදුලි කාරක සභා නිර්දේශය සහ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යොමු කිරීම සඳහා ගරු මහා සභාවට යෝජනා කරමි.

06. (එ.01.5) වත්තේගම නගර සභාව වෙත තබන ලද තැන්පතු ටෙන්ඩර් තැන්පතු මුදල් හා මිශ්‍ර) වලින් නිදහස් කර ගැනීම සඳහා මෙතෙක් ඉල්ලීම් නොකරන ලද මුදල් ( ආදායමට අදාල තැන්පතු, නිදහස් කර ගන්නා ලෙස අවස්ථා කිහිපයකදී අදාල පාර්ශවයන් දැනුවත් කලද මෙතෙක් නිදහස් කර ගැනීම සඳහා ඉදිරිපත් වී නොමැතඑසේම තැන .්පතු මුදල් නිරවුල් නොකිරීම සම්බන්ධයෙන් විගණනයේදිද විමසීමට ලක්වී තිබූ බැවින් එම තැන්පතු මුදල් සභාවේ ආදායමට ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා වන යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

07. (එ.01.6) වත්තේගම පොදු වෙළදපොල අංක දරණ ගවමස් කඩ කාමරය සඳහා මාස හයක කඩ 14 .කුලියට සමාන මුදලක් වන රු390,499.ක මුදලක් වෙළඳ ආරක්ෂණ තැන්පතු වශයෙන් තබා 98 ඇති අතර එම තැන්පතු මුදලින්, එහි බදුකරු කඩය නැවත සභාව වෙත භාරදුන් 2025.10.වන 12 383 .දින දක්වා සභාව වෙත අයවීමට ඇති හිග කඩ කුලී මුදල වන රු,583.ක මුදල පියවා ගැනීම 29 තිපත්ති කාරක සභා නිර්දේශය මත පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා වන යෝජනාව මුදල් හා ප්‍ර .ගරු මහා සභාවට ඉදිරිපත් කරමි

13.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

13.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

13.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

13.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ CPC/ACLG/K/AM/10/01/5 හා 2026.02.20 දිනැති නිරීක්ෂණ වාර්ථාවේ නිවැරදිකිරීම් අනුව 2025.11.14 දිනැති මහා සභාවේ යෝජනා නැවත ඒකමතිකව සභා සම්මත විය.**

14 <u>පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් CPC/ACLG/K/AM/10/01/2026 අංක දරන 5.02.20 දිනැති මහා සභා වාර්තා සඳහා නිරීක්ෂණ ලබා දීම -2025.12.11 මහා සභාව යන මැයෙන් එවන ලද ලිපියෙහි සඳහන් නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ලෙස ඉදිරිපත් කළ යුතු යෝජනා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා යෝජන කරමි.</u>

I. .එ)01.2 (2018.11.01 දින සිට සේවයේ යොදවාගෙන ඇති අනියම් ප්‍රජා සෞඛ්‍ය සහයක යූඒ . දිසානායක මහතාගේ සේවය අවසන් කිරීමෙන් පසු ඔහු විසින් කම්කරු කාර්යාලය වෙත කරන ලද මහනුවර උතුර , ක් කම්කරු කාර්යාලයදිස්ත්‍රි ,පැමිණිල්ලට අදාල සහකාර කම්කරු කොමසාරිස් 2025 විසින්.12.දිනැති ලිපියට අනුව පහත ගෙවීම් සිදු කළ යුතු බවට දන්වා ඇති අතර ගර 06ු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| කාල සීමාව -2018 නොවැම්බර් සිට ජූනි දක්වා 2025 | |
|---|---|
| සේවා යෝජකයා වෙතින් අයවිය යුතු මුදල | රු.139,873.20 |
| සේවකයා වෙතින් අයවිය යුතු මුදල | රු .93,248.85 |
| දායක මුදල් අයකර නොගැනීම හේතුවෙන් වන අධිභාරය | රු .110,685.25 |
| අය කළ යුතු මුළු මුදල | රු .343,807.30 |

2. .එ)01.6.අයවැය යෝජනාව සභා සම්මත කර ගැනීම 2026 (

3. .එ) 01.**IX)** පොදු වෙළඳපොල අංක වර්ෂය සඳහා කෙටිකාලීන 2026 දරණ ගව මස් කඩකාමරය 14 4 පදනම මත මාතලේ තාරලන්ද අංක/යන ලිපිනයෙහි පදිංචි මොහොමඩ් රාසික් යන අය විසින් 3 ටෙන්ඩර් මඟින්ලබාගෙන ඇත.

ටෙන්ඩර් දැන්වීම අනුව අවම ලංසුව රු.781,000.00
මොහොමඩ් රාසික් යන අය විසින් ඉල්ලීම් කළ මුදල රු.782,150.00
බදු ගිවිසුමේ කොන්දේසියට අනුව මාස කට 03 ක ආරක්ෂිත ඇප තැම්පතුව මාස 06 .රු)195,537.49අදාල ලෙස අඩුකර දෙන මෙන් කරන ලද ඉල්ලීම ගරු මහා සභාවේ අනුමැතිය ( .සඳහා ඉදිරිපත් කරමි

14.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

14.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

14.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

14.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ CPC/ACLG/K/AM/10/01/5 හා 2026.02.20 දිනැති නිරීක්ෂණ වාර්ථාවේ නිවැරදිකිරීම් අනුව 2025.12.11 දිනැති මහා සභාවේ යෝජනා නැවත ඒකමතිකව සභා සම්මත විය.**

**02.** <u>**ගරු නගර සභා මන්ත්‍රී ආර් මහතාඑස් රාජමන්ත්‍රී.ආර්.යූ.ජී.**</u>

I. අනුමැතිය වත්තේගම නගර සභාව සතු ළමා පුස්තකාල ගොඩනැගිල්ල පිහිටි ඉඩම - ජා සංවර්ධණ පවතින පිඹුරුපත අනුව නැවත මැන සලකුණු කිරීමට නිවාස හා ප්‍ර කමිටුවේනිර්දේශය පරිදි ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

02.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

02.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

02.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

02.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නගර සභාව සතු ළමා පුස්තකාල ගොඩනැගිල්ල පිහිටි ඉඩම පවතින පිඹුරුපත මැන සලකුණු කිරීමට අදාල යෝජනාව ගරු මහා සභාව ඒකමතිකව සභා සම්මත විය.**

**II.** පැරණි නගර සභා ගොඩනැගිල්ලේ සති පොළ භූමිය කොන්ක්‍රීට් කිරීම සම්බන්ධව වැඩ අධිකාරී මයා විසින් ඉදිරිපත් කර ඇති රු.350,000.00ක ඇස්තමේන්තුව ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරමි.

02.2.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

02.2.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

02.2.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

02.2.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නගර සභාවේ සති පොළ භූමිය කොන්ක්‍රිට් කිරීමට අදාල යෝජනාව ගරු මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**III.** 2026සභා අරමුදල් යටතේ ලක්ෂ02 ක මන්ත්‍රි ප්‍රතිපාදන යටතේ සිදු කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා මේ සමඟ ඇති ඇමුණුමෙහි දක්වා ඇති අතර ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

02.3.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

02.3.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

02.3.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

02.3.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නගර සභාවේ මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ 02 යටතේ සිදු කිරීමට අපේක්ෂිත යෝජනා අතරින් ප්‍රමුඛතාවය අනුව යෝජනාව ඉටු කිරීම සුදුසු බවට ගරු මහා සභාවේ ඒකමතිකව තීරණය කරන ලදි.**

| අනු අංකය | මන්ත්‍රීතුමාගේ/මන්ත්‍රීතුමියගේ නම | ව්‍යාපෘතිය | මුදල |
| --- | --- | --- | --- |
| 1. | ඒ.එම් මොනිකා අබේකෝන් මිය | • අටලහගොඩ වලව්වත්තේ සිට රවන් ඔයට යන පාරත් ඔයට පිවිසෙන මාර්ගය වැසි කාලයේදී විනාශ වී ඇත.ස්නානය කිරීම ඇතුළු අවශ්‍යතාවයන් වලට ඔයට බැසීම සඳහා පඩිපෙල් කිහිපයක් සකසා දෙන ලෙස ඉල්ලීම.<br>• අටලහගොඩ ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතිය ප්‍රභාත් මහතාගේ නිවස ඉදිරි කාණුව යටින් ජලය ප්‍රභාත් මහතාගේ නිව සෙන් මිදුලට ගලා බැසීම නිසා එය අලුත්වැඩියා කිරීම.<br>• අටලහගොඩ ප්‍රධාන මාර්ගයේ මුදුන්කොටුව මහතාගේ නිවස අසලින් යන පොදු කාණුවේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම. | ලක්ෂ 2 |
| 2. | ජේ.ඒ.යු ගමගේ මයා | • ඇල්කඩුව පාරේ නුවරතැන්න පටුමගට එහායින් ගාමිණී විජේරත්න මහතාට අයත් (අංක 54/6) | ලක්ෂ 2 |

| | | | |
|---|---|---|---|
| | | ගොඩකැලිල්ල අසලින් ආරම්භ වී ඉහලට ඇති සඩිපොල කෙළවර අඩි 60 ක දිග ප්‍රමාණයක මාර්ග කොටස අයිනේ කාණුද සහිත කොන්ක්‍රීට් කිරීම සිදු කළ යුතුය | |
| 3. | පී.බී තුන්ගල්ගේ මයා | • අවලුගමගොඩ අඩිසාර ඉහිවිට ඇති මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම . (සෙනෙවිරත්න මහතාගේ නිවස දක්වා දිවෙන මාර්ගය . මාර්ගයේ පළල අඩි 6 යි) | ලක්ෂ 2 |
| 4. | ජී.ජී රංජිත් ගුණවර්ධන මයා | • දලුපොතුකුඹුර මාර්ගයේ අඩි සාර අඩි 4 ට කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | ලක්ෂ 2 |
| 5. | ආර්. ජී.යු ආර්.එස් රාජමන්ත්‍රී මයා | • මිටියේගෙදර රත්නායකගෙදර සාර අතුරු මාර්ගය මියම්ලා යාය අසලින් වංගේත්ත නිවස අසලින් යන අතුරු මාර්ගය අඩි 8ක් පළල අඩි 200ක මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | ලක්ෂ 2 |
| 6. | දුමින්ද පෙරේරා මයා | • සින්නාලන්ද ගලගෙදර සාර අවසන් වන ස්ථානය අසලින් නිවාස 07 කට පමණ යාමට ඇති සාර වාහනයකින් යාමට නොහැකි වන අයුරින් බෑවුමක් පිහිටා ඇත. එම බෑවුම අඩුකර එම මාර්ගය වාහනයක් යාමට හැකි වන අයුරින් සකස් කිරීම | ලක්ෂ 2 |

| | | | |
|---|---|---|---|
| 7. | ඊ . ජී.ජේ ආරියවංශ මයා | • යටිරාවණ ග්‍රාම සේවා වසමේ පිහිටා ඇති පූජා ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම | ලක්ෂ 2 |
| 8. | ප්‍රියන්ත පුෂ්පකුමාර මයා | • අඩු ආදායම්ලාභි පවුල් 2 ක් සඳහා නිවාස සාදා ගැනීමට ද්‍රව්‍ය ආධාර ලබාදීම. | ලක්ෂ 2 |
| 9. | ඒ.බී වීරකෝන් මයා | • අටලහගොඩ කොට්ඨාශයේ අඹගස්තැන්න රවන්ඔය දක්වා මාර්ගය පිළිසකර කිරීම.<br>• අටලහගොඩ කොට්ඨාශයේ කොරහිටියාදෙණිය මාර්ගය පිළිසකර කිරීම. | ලක්ෂ 2 |
| 10. | ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී.එන් විජේනායක මයා | • උඩුරාවණ - හලුවන ගම්මැද්ද පාර පින්නලන්ද පාරට යාමට ඇති මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම.<br>• කුඩුගල පාර කොස්ගස්හන්දිය ඇතුල් පාර මැද කොටස ගිලාබැස ඇති බෝක්කුව පිළිසකර කිරීම.<br>• අරලියලන්ද මාර්ගයේ අවසාන කොටස ආසන්නයේ මාර්ගය ගිලා බැස ඇති ස්ථානය පිළිසකර කිරීම හා බෝක්කුවක් සෑදීම | ලක්ෂ 2 |
| 11. | සුභද්‍රා විජේසූරිය මිය | • මුදුනේගම්මැද්ද මාර්ගයට පිවිසෙන ස්ථානය සකස් කර | |

| | | | |
|---|---|---|---|
| | | ගැනීම. ( ජලය පිරී වලින් බවට පත් වී ඉතා කුඩා කොටසක් ඉතිරි වී ඇත.)<br>• මුද්දෙනේගමමැද්දට පිවිසුම් මාර්ගයේ ඉතිරි වී ඇති පැති බැම්ම ඉදිකිරීම.<br>• මුදුනේගමමැද්ද මාර්ගයේ ජලය බැසයාම සඳහා සකස් කර ඇති කාණුව උඩින් සකසා ඇති කම්බි දැල නිසි ලෙස සකස් කරගැනීම. ( මෙම මාර්ගයට වඩා පහළින් ඇති බැවින් මාර්ගයට සමානව දැල සකස් කර ගැනීමට) | ලක්ෂ 2 |
| 12. | අයි.එම්.එස් රුවන්දි රණසිංහ මිය | • වරකාගස්තැන්න ග්‍රාමයේ තන්දකසේම මහතාගේ නිවස අසලින් පහලට ඇති මාර්ගයේ ඇලෙන් මෙගොඩ කොටසක් කොන්ක්‍රීට් දමා පිළිසකර කිරීම.<br>• එමෙන්ම ඇලෙන් එගොඩ සිටින ජනතාවට යාමට ඇල හරහා පාලමක් ඉදිකර මාර්ගය සකස් කිරීම.<br>• එමෙන්ම යතුරු පැදියකින් හෝ යාමට හැකිවන පරිදි පාලම ඉදිකර ගැනීම. | ලක්ෂ 2 |
| 13. | ඩබ්ලිව් . වී. රාජමන්ත්‍රී මයා | • භාරංදණ්ඩ පාර සමග දිවෙන කාණු පද්ධතිය නිසි ලෙස ජලය ගලා නොබසින බැවින් විශාල ප්‍රශ්න රාශියක් මතු වී ඇති බැවින් එම කාණු | ලක්ෂ 2 |

| | | | |
|---|---|---|---|
| | | පද්ධතිය නිසි ලෙස ජලය ගලා යන ලෙස සැකසීම. | |
| 14. | ඩී.ඩබ්.පී අනුර කුමාර මයා | • මහවිද්‍යාල පාරේ ගලහිටියාව මහතාගේ නිවස අසල සිට කුමාරවෙල් පවනත් (140/D නිවස ) මහතාගේ නිවස දක්වා කාණුව අඩි 40 ක් (පළල 8) කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | ලක්ෂ 2 |

**03** දිට්වා ආපදා සමයේ වත්තේගම නගර සභා බල ප්‍රදේශයේ හානි වූ මාර්ගපාලම ,ඁ පැති බැමි , තිපාදන වල දළ ඇස්තමේන්තුව ගරු මහා ප්‍රබෝක්කු හා වත්කම් පිළිබඳ තොරතුරු හා අවශ්‍ය .සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරමි

වත්තේගම නගර සභාව

| අනු අංකය | ආපදා තත්වය නිසා හානි වූ භෞතික හා යටිතල පහසුකම් විස්තර | | දළ ඇස්තමේන්තුව රු.මි |
|---|---|---|---|
| | භෞතික හා යටිතල පහසුකම් | ප්‍රමාණය | |
| 1 | නුවරතැන්න පාර | 40m | මිලියන 25 |
| 2 | බලහෙල පාර | 7 m | මිලියන 1 |
| 3 | අරලියලන්ද පාර | 110 m | මිලියන 2 |
| 4 | නාරංදෙණිඩ පාර | 60 m | මිලියන 10 |
| 5 | ජාතික නිවාස පාර ( අත්කම් නිවාස පාර) | 50m | මිලියන 1.5 |
| 6 | පන්සල පාර | 75 m | ලක්ෂ 15 |
| 7 | බලහෙල පාර | 75m | මිලියන 10 |
| 8 | අටලහගොඩ පාරේ නාය ගිය කොටස | 10m | මිලියන 4 |
| 9 | කුඩුගල පටුමග | | මිලියන4 |
| 10 | බලහෙල පාර | 15m | මිලියන8 |
| 11 | කුඩුගල පාරෙන් ආරම්භ වන කමත පාර | | මිලියන10 |
| 12 | බලහෙල පිටියේගෙදර මාර්ගය වැලිකල ගේ අසලින් පිටියේගෙදර දෙසට හැරෙන වෙල අයිනෙන් තියෙන මාර්ගය | | මිලියන 1 |
| 13 | අටලහගොඩ බලහෙල සම්බන්ධ කරන රවත්ඔය හරහා ඉදිකර තිබූ පාලම සම්පූර්ණයෙන් කැඩී ගොස් ඇත. | තිබූ පාලමේ දිග 50' 0' පළල 8' 0' | මිලියන 14 |
| 14 | යටිරාවණ ඇළඋඩවත්ත ගමට යන මාර්ගයට ඇළ හරහා යොදා තිබූ පවු පාලම කැඩී ඇත. | තිබූ පවු පාලමේ දිග 8' 0' පළල 8' 0' | මිලියන 5 |
| 15 | පිටියේගෙදර රාමචන්ද ජනපද පාර පාලමේ අත්වැට කැඩී ඇත. | | මිලියන 10 |
| 16 | අටලහගොඩ අඩිපාර සිට දුම්රිය මාර්ගය දක්වා දිවෙන මාර්ගය අංක 20/18 ඉඹුලාවත්ත ඉන්දික කුමාර මහතාගේ නිවස අසල ඇති බෝක්කුව - | අඩි 10ක් පමණ | මිලියන 8 |
| 17 | යටිරාවණ ඇළ උඩවත්ත මාර්ගයේ නායගිය ස්ථානය සදහා බැම්ම ඉදිකිරීම හා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | | මිලියන 4 |
| 18 | නුවරතැන්න ග්‍රාමයේ ක්‍රීඩාපිටිය අසල මාර්ගයේ පැති කාණු හා බෝක්කුව ඉදිකිරිම | | මිලියන 2 |
| 19 | නුවරතැන්න පාරේ බෝක්කුවක් ඉදිකිරිම | | මිලියන 2 |
| 20 | දෙල්ගහපිහිල්ල අසල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරිම | | මිලියන 8 |
| 21 | අටලහගොඩ මීරකල් පෙරපාසල අසලින් යන මාර්ගයේ නාය ගිය ස්ථානය සදහා පැති බැම් ඉදිකිරිම. | | මිලියන 8 |
| 22 | අරලියලන්ද පාරේ නායගිය ස්ථාන සදහා පැතිකාණු හා මණු බිල් ඉදිකිරිම | | මිලියන 3 |
| 23 | බලහෙල පිටියේගෙදර මාර්ගයේ කාණුව ඉදිකිරීම | | මිලියන 2 |
| 24 | නාරංදෙණිඩ මාර්ගයේ පැති කාණු ඉදිකිරිම | | මිලියන 2.5 |
| 25 | ඇළ උඩවත්ත මාර්ගයේ ඉහළ කොටස නන්දනී මහත්මියගේ ගේ අසලින් නායගොස් ඇති ස්ථානයට බැම්මක් ඉදිකිරීම | | මිලියන 4 |
| 26 | රාස්ඇල්ල, මංගලගිරිකන්ද, පුංචිමෝල යන ජල ව්‍යාපෘති 03 හරහා සියලූ ජල සැපයුම් සිදු කරන අතර ජල නල ආපදාවට ලක් විය. | | මිලියන 35 |
| 27 | පරණ නගර සභා ගොඩනැගිල්ලේ වහලයට හා බිත්තිවලට හානි සිදුවීම | | මිලියන 2 |
| | | | |
| | | | 187.5 |

04 තිපාදන වෙන්පළාත් සහා ආධාර යටතේ වත්තේගම නගර සභාව වෙත ප්‍ර 2026වූ ව්‍යාපෘති අතරින් පහත ව්‍යාපෘති දේශීය සම්බන්ධිකරන කමිටු අනුමැතියද සංශෝධනය කළ අතර මේ සඳහා ප්‍රා 02 .ඒ අනුව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි .ලබාගෙන ඇත

2026 පළාත් සභා අරමුදල් යටතේ සිදු කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා දෙකක් සංශෝධනය කිරීම

| අනු අංකය | වැඩසටහන | ව්‍යාපෘතිය | සංශෝධනය විය යුතු ආකාරය | මුදල රුපියල් මිලියන |
|---|---|---|---|---|
| 01 | ප්‍රජා ජල | රාස්ඇල්ල ජල මූලාශ්‍රය නවීකරණය කිරීම, පෙරහන් ටැංකිවල පෙරහන් මාධ්‍ය ඉවත් කිරීම හා නව පෙරහන් මාධ්‍ය ස්ථාපනය කිරීම | රාස්ඇල්ල ජල මූලාශ්‍රය සංවර්ධනය කිරීම | මි 7.50 |
| 05 | ප්‍රජා ජල | පුංචිමෝල ජල මූලාශ්‍රය සඳහා පෙරහන් මාධ්‍ය ඉදිකිරීම හා අනෙකුත් සංවර්ධන කටයුතු කිරීම | පුංචිමෝල ජල මූලාශ්‍රය සංවර්ධනය කිරීම | මි 10.00 |

05 <u>ගරු නගර සභා මන්ත්‍රී බීඩී පෙරේරා.ඒ. මහතා</u>

I. දෙල්ගහලන්ද වත්ත ඉඩමේ ඔප්පු නොමැති පදිංචිකරුවන් 47 දෙන වෙනුවෙන් පිඹුරුපත් සකස් කර අවසන් බැවින්නුකූලව ඔප්පු ලබා දීම සඳහා මූලික සැළසුම් නිරාකරනය නීත්‍යා , ඉන් අනතුරුව තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකර නව තක්සේරු .සඳහා යොමු කර ඇත එකී තක්සේරුව ලබගත් පසු මෙම ඉඩමේ අයිතිය බැහැර කර ගැනීම සඳහා ,ලබා ගැනීමටත් ගරු ආණ්ඩුකා ාර අනුමැතියට යැවීම සඳහා යොමු කිරීමටත්අනුමැතිය ලබා ගැනීම සඳහා , .ගරු මහා සභාව වෙත යොමු කරමි

05.1.1 ඒ අනුව ගරු නගර සභා උප සභිපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

05.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

05.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

05.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම දෙලගහලන්ද ඉඩමේ ඔප්පු නොමැති පදිංචිකරුවන් 47 දෙනා සඳහා ඔප්පු ලබා දීමේ යෝජනාව ගරු මහා සභාවේ ඒකමතිකව තීරණය කරන ලදි.**

II. ගරු ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනීමේන් අනතුරුව මෙම පදිංචිකරුවන් දෙනා සඳහා නගර සභා 47 36 ආඥා පනතේ(ඉ (l වගන්තිය යටතේ ඔප්පු ලබා දීමටද අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරමි.

05.2.1 ඒ අනුව ගරු නගර සභා උප සභිපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනව ස්ථ්ර කරන ලදි.

05.2.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්


05.2.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

05.2.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

05.2.5 ඒ අනුව ගරු උප සභාපති ජේ.ඒයූ ගමගේ විසින් බෙදීමක් අවශ්‍ය බවට ප්‍රකාශ කරන ලදි.

**ඒ අනුව සියළුම මන්ත්‍රිවරුන් පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම හේතුවෙන් ඒකමතිකව මෙම යෝජනාව සභා සම්මත විය.**



<u>වත්තේගම නගර සභාව</u>

<u>ගරු මහා සභාවේදී බෙදීමක් ඉල්ලුම් කිරීම.</u>

2026 . 03 . 12 දින පැවති මහා සභාවේදී

......................................................නිරණය සඳහා

1. යෝජනාව ඉදිරිපත් කරන්නාගේ නම :- ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා

2. යෝජනා අංකය :- අ . 03 . II

| අනු අං | සභාපති/ උප සභාපති/ මන්ත්‍රිතුමාගේ නම | පක්ෂයි | විපක්ෂයි |
|---|---|---|---|
| 1. | ඩී.එස්. උයන්ගොඩ මහතා - ගරු සභාපති | ✓ | |
| 2. | ජේ.ඒ.යූ. ගමගේ මහතා - ගරු උප සභාපති | ✓ | |
| 3. | එච්.පී. පුෂ්ප කුමාර මහතා | ✓ | |
| 4. | ඒ.එම්.එම්. අබේකෝන් මහත්මිය | ✓ | |
| 5. | ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මහතා | ✓ | |
| 6. | සී.ඩී. ගුරුගල්ගේ මහතා | නොපැමිණි | |
| 7. | බී.ඒ.ඩී. පෙරේරා මහතා | ✓ | |
| 8. | ටී.ජී.ජේ. ආරියවංශ මහතා | ✓ | |
| 9. | ඒ.පී.ආර්.ගුණවර්ධන මහතා | ✓ | |
| 10. | ආර්.ජී.යූ.එස්. රාජමන්ත්‍රී මහතා | ✓ | |
| 11. | ඩබ්.එම්.ජී. නිශ්ශංක විජේනායක මයා | ✓ | |
| 12. | ඩී.පී.එස්. විජේසූරිය මහත්මිය | ✓ | |
| 13. | අයි.එම්.එස්.ආර්. රණසිංහ මහත්මිය | ✓ | |
| 14. | ඒ.පී.සී.ආර්. ජයවීර මහතා | නොපැමිණි | |
| 15. | ඩබ්.ටී. රාජමන්ත්‍රී මහතා | ✓ | |
| 16. | ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මහතා | ✓ | |
| 17. | තිරක ඡන්දය | | |
| | එකතුව | 14 | |

ඒ අනුව වැඩි ඡන්ද ..........14.......... ප්‍රමාණයකින් මෙම යෝජනාව සභා සම්මත විය./ ~~ප්‍රතික්ෂේප විය.~~

ඩී.එස් උයන්ගොඩ,
සභාපති,
නගර සභාව,
වත්තේගම.

වී.බී වස්ගේවත්ත,
ලේකම්,
නගර සභාව,
වත්තේගම.

20.26..../..03../...12.. දින මහා සභාවට
ඉදිරිපත් කරන ලදී.
අනුමත කලා/ ~~ප්‍රතික්ෂේප කලා~~ / ~~ඉදිරියට කල් තැබුවා.~~
යෝජනා අංකය : ....අ. 03. II....

සෙසු කරුණු (ඔ)

1. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

2. කාරක සභා වාර්තා සලකා බැලීම
   I. 2026.02.17 දින පැවති නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ වාර්තාව සලකා බැලීම.
   II. 2026.02.17 දින පැවති පරිසර හා සෞඛ්‍ය කාරක සභාවේ වාර්තාව සලකා බැලීම.
   III. 2026.02.18 දින පැවති කර්මාන්තජල හා විදුලි කාරක සභාවේ වාර්තාව , සලකා බැලීම.
   IV. 2026.02.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාව සලකා බැලීම.

3. මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසරය -ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා - ශ්‍රී ලංකා පාසල් වෙස් සංගමයේ මහා සභා රැස්වීමට සහභාගි වීම සඳහා.

ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.කේ.ආර් ජයවීර මැතිතුමා පෞද්ගලික අවශ්‍යතාවයක් මත නිවාඩු ලබාගෙන ඇත.

4. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.

<u>(ඔ).4.1.1 ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මම කියන්න කැමති අපි මේ සභාවේදී ගන්න තීරණ සඳහා එකඟතාවය පල කරන්නේ සහයෝගය දක්වන්නේ අපි එක කණ්ඩායමක් ලෙස කටයුතු කළයුතු නිසා. ඒ නිසා මෙම සභාවෙන් යම් කටයුත්තක් සිදු වෙනවානම ඒ පිළිබඳව සියළුම මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එවිට ජනතාවට හා ව්‍යාපාරික ප්‍රජාවට නිවැරදි තොරතුරු ලබා දීමට හැකියාව පවතිනවා. ඒ අනුව නව රෝහල ඉදිකිරීම පිළිබඳව විපක්ෂය ලෙස අපිවත් දැනුවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>(ඔ).4.2.1 ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය</u>

ගරු සභාපතිතුමනි මම දැක්ක බස් නැවතුම්පොල අසල කොන්ක්‍රීට් ලෑල්ල උඩ කළු පැහැති ත්‍රී රෝද රථයක් නවතා තියෙනවා. ඒක ඉවත් කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>(ඔ).4.3.1 ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මම දැක්කා මුහුණු පොතේ පෝස්ට් එකක් යොදලා තියෙනවා වත්තේගම ප්‍රදේශයේ කිසිම වැඩක් වෙලා නෑ. ඒ නිසා රෝහල වත්තේගමින් ගිලිහෙන්න යනවා කියලා.

ඉතින් ඒ සඳහා මම ප්‍රති පණිවිඩයක් ලෙස මුහුණු පොතේ සඳහන් කලා වත්තේගම මේ දක්වා කරලා තියෙන සංවර්ධණය පිළිබඳව.එනම්

වත්තේගම රෝහල - මිලියන 1800
බස් නැවතුම්පොල වැසිකිලි පද්ධතිය - මිලියන 1.75
දෙමළ පාසල -රුපියල් ලක්ෂ 25
යටිරාවණ පාසල -රුපියල් ලක්ෂ 5
මන්ත්‍රී කොට්ඨාස සංවර්ධනය - එක් මන්ත්‍රී කොට්ඨාසයක පමණක් රුපියල් ලක්ස 25ක පමණ වැඩ කටයුතු අවසන් වී ඇත.
සහනාදාර - මාගේ හා උප සභාපතිතුමාගේ වසමේ පමණක් රු.25,000.00 බැගින් පුද්ගලයන් 145 දෙනෙක්ට ලබා දී තියෙනවා. ඒ ලෙස අනෙකුත් කොට්ඨාශ වලත් මේ විදියට සහනාදාර ලබා දීම් සිදු වෙලා තියෙනවා.

රෝහල පිළිබඳව වර්ථමාන තත්වය ගරු සභාපතිතුමා පැහැදිලි කිරීමක් කරනු ඇතැයි මම සිතනවා.

(ඹ).4.4.1 ගරු නගර සභා මන්ත්‍රී ආ්ර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මැතිතුමා
ගරු සභාපතිතුමනි, මම කියන්න කැමති මෙම නගර සභාවට පිවිදෙන ගේට්ටු දෙක ඉතා අබලන්ව ඇති බැවින් ගේට්ටු සංවර්ධනය කිරීමට කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

(ඹ) 4.4.2 ඒ වගේම සභාපතිතුමනි මේ ගස් වල කොල වැටෙන කාලේ ඉතින් රෝහලට යන පාරේ කිහිප දෙනෙක් වැටිලා තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව රෝහලේ පුද්ගලන් දැනුවත් කරලා රෝහල් පරිශ්‍රය පිරිසිදු කරන්න කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

(ඹ).4.5.1 ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා
ගරු සභාපතිතුමනි අපේ විජේනායක මැතිතුමා පැවසුව පාරවල් කිහිපයක පස් ඉවත් කර ගැනීමට අවශය බව. නමුත් මෙම මාර්ග වල බැකෝ යන්ත්‍රය ගමන් කරන්න බෑ. ඒ නිසා මම යෝජනා කරනවා excavator එකක් යොදාගෙන මෙම කටයුත්ත සිදුකර ඊට අදාල මුදල සභා අරමුදලින් ගෙවීම් සිදුකරමු කියලා.

4.5.2 ඒ වගේම නගර සභාව සතු වෙබ් පිටුවට අපි සිදු කරන වැඩ කටයුතු පිළිබඳව සඳහන් කරමින් මෙම වෙබ් පිටුව යාවත්කාලීන කිරීමට කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

(ඹ).4.6.1 ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර් ගුනවර්ධණ මැතිතුමා
ගරු සභාපතිතුමනි, වෙනදා වගේම මට කියන්න තියෙන්නේ ජල බිල්පත් වල ගැටළුවක් පවතිනවා මේ පිළිබඳව සොයා බැලීමක් සිදු කරලා ඊට සුදුසු විසඳුමක් කඩිනමින් ලබා ගන්න කියලා.

4.6.2 ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා,
ගරු මන්ත්‍රිතුමනි මේ සඳහා අද අපිට විසිදුමක් අපිට දැන් ලබුණා. ඒ අනුව දැනුවත් කිරීමේ වැඩසටහනක් මේ වන විටත් ZOOM තාක්ෂනය යටතේ සිදු වෙමින් පවතිනවා. ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**பொது நிருவாக, மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**
**Ministry of Public Administration, Provincial Councils and Local Government**

පළාත් සභා සහ පළාත් පාලන අංශය
330, යුනියන් පෙදෙස, කොළඹ 02.

மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரிவு
330, யூனியன் பிளேஸ், கொழும்பு 02.

Provincial Councils and Local Government Division
330, Union Place, Colombo 02.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2305326
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2329725
ඊ-මේල් / மின்னஞ்சல் / Email: secretary@pclg.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: https://mpclg.gov.lk/

මගේ අංකය / எனது இல / My No: PL/7/11/01/-iii තාව
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.03. 09

පළාත් පාලන කොමසාරිස්වරුන්
බස්නාහිර, දකුණ,ඌව,මධ්‍යම, සබරගමුව,උතුරු මැද, වයඹ පළාත

පළාත් පාලන ආයතන ප්‍රධානීන්
බස්නාහිර, දකුණ,ඌව,මධ්‍යම, සබරගමුව,උතුරු මැද, වයඹ පළාත

**<u>පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබා දීම.</u>**

පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබා දීම උදෙසා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති LGPMS මෘදුකාංග පද්ධතිය සම්බන්ධයෙන් ඔබ පළාතේ සියලුම පළාත් පාලන ආයතන දැනුවත් කිරීමට අවශ්‍ය වී ඇත. මේ වන විට LGPMS මෘදුකාංග පද්ධතිය ජල බිල්පත්,වරිපනම්, Parking පහසුකම්, කඩකුලී, මහජන පැමිණිලි ඇතුළු පළාත් පාලන ආයතනයේ අවශ්‍යතා පරිදි සියලුම යෙදවීම් ඇතුළත් කර සකස් කර ඇත.

02. එබැවින් එම දැනුවත් කිරීමේ වැඩසටහන Zoom තාක්ෂණය ඔස්සේ පහත සඳහන් පරිදි පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති අතර . ඒ සඳහා පළාත් පාලන ආයතනයකින් ලේකම්, ආදායම් විෂය භාර නිලධාරීන්, මුදල් අයකැමි සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| දිනය | - | 2026.03.12 |
| වේලාව | - | පෙ.ව 9.00 |

03.මෙම Zoom සබැඳිය එකවර 500 දෙනෙකුට පමණක් සම්බන්ධ විය හැකි බැවින් ධාරිතාවය ඉක්මවා නොයන පරිදි එක් පළාත් පාලන ආයතනයකින් සහභාගී වන සියලුම දෙනා එකම ස්ථානයක සිට මෙම වැඩසටහන සඳහා සහභාගී කරවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. මේ සඳහා අවශ්‍ය Zoom සබැඳිය ඉදිරියේදී ඔබ වෙත ලබා දීමට කටයුතු කරන අතර නොමිලයේ ලබා දෙන මෙම මෘදුකාංග පද්ධතිය ඔබගේ පළාත් පාලන ආයතන වෙත හඳුන්වා දීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එම්.කොඩිප්පිලි ආරච්චි
අතිරේක ලේකම් (පළාත් සභා සහ පළාත් පාලන)
ලේකම් වෙනුවට

දුරකතන අංකය -011-2328428 ෆැක්ස් අංකය 011-2328282 විද්‍යුත්තැපැල - lgdiv@pclg.gov.lk

පිටපත
01. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා දැනුවත් කිරීම සඳහා

Scanned with CamScanner

(ඔ).4.7.1 ගරු නගර සභා මන්ත්‍රී ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා

ගරු සභාපතිතුමනි කසල එකතු කිරීමේ ක්‍රමවත් භාවයක් නෑ.ඒ වගේම ට්‍රැක්ටරයට සමහර පාරවල් වල යන්න විදියක් නෑ. ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් යොදන්න කියලා මා ඉල්ලා සිටිනවා.

5. ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීම්.

(ඔ).5.1 බස් නැවතුම්පොල කොන්ක්‍රීට් ලැල්ල උඩ ත්‍රී රෝද රථය පිළිබඳව කිහිප විටක් පැමිණිලි කරත් එතන ස්ථාන භාර නිළධාරීතුමා අපිට සහයෝගය ලබා දෙන්නේ නෑ.
5.2 රෝහල් භූමිය පිරිසිදු කරන්න මම ඩී.එම්.ඕ හට පවසන්නම්
5.3 පාරවල් වල පස් ඉවත් කර ගැනීමට excavator යන්ත්‍ර සඳහා නැවත මිල ගණන් කැඳවීමකට සූදානම් කිරීමට බලාපොරොත්තු වෙනවා.
5.4 වෙබ් අඩවියේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා අදාල විෂය භාර නිළධාරියාව දැනුවත් කරමු.
5.5 කසල එක්රැස් කිරීමේ ගැටළුවක් තියෙනවා. මේ නිසා මම දැනට ත්‍රී රෝද රථයක්,බැකෝ යන්ත්‍රයක් හා ටිපර් රථයක් ඉල්ලලා තියෙනවා ඒවා නොලැබුනොත් දැනට වෙන්දේසි කිරීමට කටයුතු යොදලා තියෙන වාහන වලින් එන මුදලින් මිලදී ගැනීමට හරි කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගති වාර්තා හා වෙනත් ලිපිමාසික අයවැය සටහන් හා කර්මාන්ත පිළිබඳ ප්‍ර (ක)

1. ජනවාරි මස ඉන්දන වාර්තාව 2026 සලකා බැලීම.

**සභාවේ නිමාව**

ගරු සභාපති ඩී.එස්.උයන්ගොඩ මැතිතුමා විසින් සභාවේ කටයුතු පෙ.ව 11.41 ට අවසන් කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
සභාපති
වත්තේගම නගර සභාව

....................................... දින පැවති මාසික මහා සභාවේ වාර්තාව සහා සම්මත කිරීම

සංශෝධන

.........................................................................................................................................
.........................................................................................................................................
.........................................................................................................................................
.........................................................................................................................................
.........................................................................................................................................
..................................................

2026 ..................... මස........................වන දින පැවති, 2026 ..................මස මාසික මහා සභාවේ රැස්වීම් වාර්තාව ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ......................................................................... මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ...................................................................... මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2026 ................. මස ................. දින පැවති මහා සභාවේදී ඒකමතිකව සහා සම්මත කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
ගරු සභාපති
වත්තේගම නගර